# ඒකීය රාජ්‍යය සංකල්පය ජයගනියි

මහින්ද රාජපක්ෂ මහතා විශිෂ්ට ජයග්‍රහණයක් අත්පත් කරගෙන ඇත. ඒ ජයග්‍රහණය විශිෂ්ට වනුයේ කරුණු කිහිපයක් හේතුකොටගෙන ය. පළමුවෙන් ම සියළු විජාතික බලවේග ඒ මහතාට එරෙහිව පෙළගැසුණි. සතිඅන්ත පත්තර කඩමාළුවල සිට බැංකු රක්ෂණ ව්‍යාපාර හිමියන් දක්වා ව්‍යාපාරිකයෝ ද, රාජ්‍ය නොවන සංවිධාන ද, ජනමාධ්‍ය නමින් පෙනීසිටින ජඩමාධ්‍ය ද පමණක් නොව ශ්‍රී ල නි පක්ෂයේ නායකත්වය ද, ඒ විජාතික බලවේග අතර විය. චන්ද්‍රිකා කුමාරතුංග මහත්මිය සහ අනුර බණ්ඩාරනායක මහතා ද ඔවුන් අනුව ගිය ඇතැම් ඇමතිවරු, නියෝජ්‍ය ඇමතිවරු හා ශ්‍රී ල නි ප මන්ත්‍රීවරු ද රාජපක්ෂ මහතාට සම්පූර්ණ සහාය නුදුන්නේ යැයි කීම ඇඟ බේරාගැනීමක් වෙයි. ඔවුහු ඒ මහතාට කිසිම සහායක් නුදුන්නා පමණක් නොව ඇතැම් අවස්ථාවල ඒ මහතාට අකුල් හෙළූහ. රාජපක්ෂ මහතාගේ මැතිවරණ ව්‍යාපාරයට ශ්‍රී ල නි පක්ෂයේ අරමුදල්වලින් ලැබුණු දායකත්වය කුමක් ද?

රනිල් වික්‍රමසිංහ මහතාගේ ඡන්ද ව්‍යාපාරයට මුදල් වියදම්කෙරී ඇත්තේ රුපියල් බිලියනවලින් ය. එනම් රුපියල් සියක්කෝටිවලින් ය. ඒ මුදල ඒ මහතා මෙරට ජනතාවට දීම සඳහා බුෂ් ජනාධිපතිවරයාගෙන් ඉල්ලාගැනීමට බලාපොරොත්තු වූ මුදලට වඩා බෙහෙවින් වැඩි ය. ඒ මුදල් ඒ මහතාට ලැබුණේ කෙසේ ද? ඇතැම් ජඩමාධ්‍ය රනිල් වික්‍රමසිංහ මහතා වෙනුවෙන් දැන්වීම් පළකෙළේ මුදල් ගෙවා ප්‍රචාරය කෙරිණි යන අත්වැල ද සමගින් ය. ඒ සැබෑ නම් ඒ ජඩමාධ්‍යවලට රනිල් වික්‍රමසිංහ මහතාගේ ඡන්ද ව්‍යාපාරයෙන් පමණක් විශාල මුදලක් ලැබෙන්නට ඇත. ආදායම් බදු දෙපාර්තමේන්තුව ඒ අමතර ආදායම පිළිබඳ සොයාබලනු ඇතැයි සිතමි.

පුවත්පත්වල දිනපතා පිටු ගණන් දැන්වීම් පළකළ රක්ෂණ, බැංකු හා වෙනත් ව්‍යාපාරිකයා මුළුමනින් ම සිංහල බෞද්ධ විරෝධී ව්‍යාපාරයක් ගෙනගියේ ය. බෞද්ධ පවුලක උපත ලැබූ මොහු ඊනියා දේවභාසකමකින් පසුව කතෝලිකයකු වූ බව පැවසෙයි. ගිනිපෑගීම ගැන කසිකබල් විද්‍යාත්මක කතා කියන කසිකබල් මහාචාර්යවරු මේ දේවභාසකම්, දේව දර්ශන ගැන ඊනියා පරයේෂණ නොපවත්වන්නේ ඒ මහාචාර්යවරු කතෝලික පවුල්වල උපත ලබාඇති හෙයින් ද? අප මෙවැනි ප්‍රශ්න අසනවිට අපට ආගම්වාදී ලේබලය ඇලවීමට සූදානම්වූවෝ වෙති. මොවුන් අර ව්‍යාපාරිකයා කිතුණුවනි අව්දිව්වි යන තේමාවෙන් දැන්වීම් පළකරන විට එය ආගම්වාදී ක්‍රියාවක් යැයි කියන බවක් දැනගැනීමට නැත. මේ ව්‍යාපාරිකයාගේ බැංකුවල සේවාදායකයන්ගෙන් අතිවිශාල බහුතරය සිංහල බෞද්ධයෝ වෙති. ඔවුන්ට තම ගිණුම් තවදුරටත් ඒ බැංකුවේ පවත්වාගෙන යෑමට අවශ්‍ය දැයි අපි නො දනිමු. මේ නෙයිනගෙ සුදුව කෙළවරවන්නේ කෙසේ දැයි අපි මහත් ඕනෑකමකින් බලාසිටිමු.

මෙරට සාමාන්‍ය සිංහල බෞද්ධයන් තමන්ට බටහිර ක්‍රිස්තියානි යටත්විජිතවාදීන්ගෙන් සිදු වී ඇති අසාධාරණකම් හේතුවෙන් අහිමි වූ දෑ ආපසු ලබාගැනීමේ දී සාමාන්‍ය සිංහල ක්‍රිස්තියානි හා කතෝලික බැතිමතුන් එයට විරුද්ධ නොවන මුත් ඉහළ පෙලැන්තියේ සිංහල කිතුණුවෝ හා කතෝලික බැතිමත්හු විරුද්ධ වෙති. ඉහළ පෙලැන්තියේ ඇතැම් සිංහල බෞද්ධයන් යැයි කියාගන්නන් ද එහි දී විරුද්ධවන්නේ ඔවුන් සංස්කෘතියෙන් ක්‍රිස්තියානි වූ ඕල්කට් බෞද්ධයන් වන බැවින් ය. දෙමළ ප්‍රශ්නයේ ද මුල ඉංගිරිසි කතාකරන දෙමළ නායකයන් සිංහල බෞද්ධයන්ගේ යටත්විජිතවිරෝධී අරගලයට විරුද්ධවීම ය. පසුව දෙමළ කතාකරන දෙමළ ජනයා ද එයට ඇදාගනු ලැබිණි.

ඒකීය රාජ්‍යය යන්න කවදත් ශ්‍රී ල නි පක්ෂයේ ප්‍රතිපත්තිය විය. එය තාවකාලික ව වෙනස්කරනු ලැබුයේ විජාතික බලවේග විසින් මෙරටට ආනයනයකරනු ලැබූ චන්ද්‍රිකා කුමාරතුංග මහත්මිය විසින් ය. ඇය විජාතික බලවේගවල අවශ්‍යතාව පිරිදි පක්ෂයේ ප්‍රතිපත්ති හිතුමතයට වෙනස්කළා ය. පසුව ජනාධිපතිනිය වී තම ආධිපත්‍යය යොදාගනිමින් පක්ෂ සම්මේලනවල දී තමන්ට අවශ්‍ය අන්දමට වෙනස්කළා ය. දැන් ඒ වරද මහින්ද රාජපක්ෂ මහතා හා ජනතාව අතින් නිවැරදි වී ඇත. ජනතාව වැඩි ඡන්දයකින් ඒකීය රාජ්‍යය තවදුරටත් පවත්වාගෙන යා යුතු බව තීරණයකර ඇත. මේ ඉතා වැදගත් තීන්දුවකි. එය දහසකුත් එකක් බාධක, අවහිරකම්, බොරු ප්‍රචාර හා වෙනත් කැපිලි කෙටිලි හමුවේ දෙන ලද තීන්දුවකි. ශ්‍රී ල නි පක්ෂය කොල්ල කා, බණ්ඩාරනායක නම විකුණා චන්ද්‍රිකා කුමාරතුංග මහත්මිය ව්‍යාජයෙන් සන්ධිය හෙවත් ෆෙඩරල් තීන්දුවක් ජනතාවගෙන් ගත් අවස්ථාවෙහි ඊනියා උගත්තු ඒකීය රාජ්‍යය ජනතාව විසින් ප්‍රතික්ෂෙපකෙරී ඇතැයි ඝෝෂාවක් කළහ. ඒකීය රාජ්‍යයක් අවශ්‍ය විශාල පිරිසක් මෙරට ඇති බවවත්

© Prof. Nalin De Silva

පිළිගැනීමට ඔවුහු එදා අකමැති වූහ. ඔවුහු ඒකීය රාජ්‍යයක් ගැන කතාකළවුන් ජාතිවාදීන් ලෙස හංවඩුගැසූහ. ප්‍රජාතන්ත්‍රවාදය යනු බහුතරයේ මතය නොවේයැයි ඔවුහු නො කීවෝ ය. සුළුතරයේ මතයට ද කන්දීමක් ඔවුන්ට අමතක වූවා සේය. එහෙත් දැන් මේ සියල්ල මේ තක්කඩි උගතුන්ට මතක්වනු ඇත. ප්‍රජාතන්ත්‍රවාදය යනු බහුතරයේ මතය නොවන බවට ඔවුන් බයිලා කියනු ඇත. සුළුතරයටද කන්දිය යුතු බව කියනු ඇත. මේ යටත්විජිතවාදී බටහිර ක්‍රිස්තියානි රටවලින් නඩත්තුවෙන දීන ගැත්තන් කීවත් නොකීවත් සුළුතර අදහසට ද කන්දීම සිංහල බෞද්ධ සම්ප්‍රදාය වෙයි.

එහි දී අපි ප්‍රශ්නයේ මුලට යමු. දෙමළ ජනයාට දෙමළ වීම නිසා ම ඇති අසාධාරණයක් නැත. මේ ප්‍රශ්නය පටන්ගැනුනේ ඉංගිරිසි උගත් දෙමළ ජනයා බ්‍රිතානීන් විසින් සිංහලයන්ට එරෙහිව මෙහෙයවනු ලැබීමේ ප්‍රතිඵලයක් ලෙස ය. මධ්‍යයෙහි (ව්‍යවස්ථාදායක සභාවෙහි, රාජ්‍ය මන්ත්‍රණසභාවෙහි හා පාර්ලිමේන්තුවෙහි) තමන්ගේ බලය රඳවාගැනීමට ඔවුහු බ්‍රිතානීන් සමග කුමන්ත්‍රණය කළහ. එහෙත් සිංහල බහුතරය විසින් සිංහල මන්ත්‍රීන් වැඩි සංඛ්‍යාවක් පාර්ලිමේන්තුවට එවනු ලැබීම වැළැක්විය නොහැකි බැව් තේරුම්ගත් චෙල්වනායගම් නම් දෙමළ ජාතිවාදියා 1947 දී ඉලංකෙයි තමිල් අරසු කච්චි හෙවත් ලංකා දෙමළ රාජ්‍ය පක්ෂය පිහිටුවා ගත්තේ ය. දෙමළ ජාතිවාදීන් මධ්‍යයෙහි බලය ගැනීමේ සිට වෙන ම රාජ්‍යයක් කරා ගියේ එලෙසින් මිස දෙමළ ජනයාට වූ අසාධාරණයක් නිසා නො වෙයි. දෙමළ රාජ්‍ය පක්ෂය පිහිටවනු ලැබුයේ 1956ට පෙර බව අමතක නොකළ යුතු ය. අද දෙමළ ජනයාට තමන්ට අසාධාරණයක් ඇතැයි යනුවෙන් ඒත්තුගැන්වී ඇත. ඔවුන්ගෙන් ඇතැමකු ආයුධ අතටගෙන ඇත්තේ එබැවින් ය. නැති කම්කරු පන්ති රාජ්‍යයක් ඇතිකිරීමට ආයුධ අතට ගැනීමට මිනිසුන් පෙළඹවිය හැකි ය.

මෙරට බහුතරය සිංහල බවත් මෙහි අනන්‍ය සංස්කෘතියක් ගොඩනගනු ලැබුයේ ඔවුන් විසින් බවත් කිසිවකුටවත් ප්‍රතික්ෂෙපකිරීමට නො හැකි ය. මධ්‍යයෙහි සිංහල මන්ත්‍රීන් බහුතරය වීම වැළැක්විය නො හැකි ය. අද කළ යුතුව ඇත්තේ ඒ බව හා මෙරට සංස්කෘතියෙහි ප්‍රධාන සංරචකය සිංහල බෞද්ධ බව පිළිගනිමින් මධ්‍යයෙහි රාජ්‍ය පාලනයට දෙමළ හා මුස්ලිම් මන්ත්‍රීන් හවුල්කර ගැනීම ය. එය කරන්නේ කෙසේ ද යන්න වෙන ම සාකච්ඡා කළ යුතු ය. එමෙන් ම පැරණි සිංහල ක්‍රමයට අනුව පරිපාලන බලතල විමධ්‍යගත කෙරිණි. ව්‍යවස්ථාදායකය මධ්‍යයෙහි තබාගනිමින් (ඒකීය බව රකිමින්) රාජ්‍ය පාලනයට දෙමළ හා මුස්ලිම් ජනයා හවුල්කරගනිමින් පරිපාලනය විමධ්‍යගත කළයුතුවෙයි.

මහින්ද රාජපක්ෂ මහතාට ඡන්ද ලැබී ඇත්තේ සිංහලයන්ගෙන් බව පැහැදිලි ය. නායක පූජකවරුන්ට නොරුවටුණු සිංහල ක්‍රිස්තියානින් ද යම් ප්‍රමාණයක් ඡන්දය දී ඇති අතර සිංහල බෞද්ධයන්ගෙන් අති විශාල ප්‍රමාණයක් රාජපක්ෂ මහතාට ඡන්දය දී ඇත. නැගෙනහිර පළාතේ මුස්ලිම් ජනයා ද පලස්තීන මැදිහත්වීම් සියල්ල තිබියදීත් ඒ මහතාට එතරම් ප්‍රමාණයක් ඡන්දය දී නැත. සිංහල ඡන්ද ගැනීම සඳහා කරුණා බිහිවුණේ සටන් විරාම ගිවිසුම නිසා යැයි මොරගොඩ හා නවීන් දිසානායක මහතුන් ලවා කියවූ රනිල් වික්‍රමසිංහ මහතාට කොටි සංවිධානයේ ආධාරය නැතිවිණි. ඇමරිකන් තානාපති හා ජපන් තානාපති වහාම තමිල්සෙල්වන් හමුවී කොටි සංවිධානයේ අදහස් වෙනස්කරවීමට උත්සාහ කළ ද, වික්‍රමසිංහ මහතාට අල්ලපු අත්තත් පයගහපු අත්තත් දෙකම නැතිවිය. දැන් විජාතික බලවේග රාජපක්ෂ මහතා වෙනස්කිරීමට උත්සාහ කරනු ඇත. විවිධ තානාපතිවරුන් ඒ මහතා හමුවීමට උත්සාහගනු ඇත. ඊනියා ආධාර වෙනුවෙන් ප්‍රතිපත්ති වෙනස්කිරීමට බලකෙරෙනු ඇත.

පසුගිය සති කිහිපය තුළ අපේ කම, වී බිස්ස, ඉපනැල්ල හා සංස්කෘතිය ගැන කතාකළවුන් හතුපිපෙන්නාක් මෙන් මතුවිණි. රාජපක්ෂ මහතා වටා සිටින ඇතැමුන් ඒකීය රාජ්‍යයක් ගැන කතාකළ ද, ඔවුන්ගේ සිතේ ඇත්තේ සන්ධීය රාජ්‍යය ය. ඔවුන් නැවතත් රාජපක්ෂ මහතා සන්ධීය රාජ්‍යය දිශාවට තල්ලුකිරීමට උත්සාහ කරනු ඇත. ඔවුන් කවුරුන් වුවත් කිනම් මට්ටමක වුවත් ඔවුන් පරාජය කළයුතු ය. අද ජාතිකත්වය ගැන කතාකරන්නවුන් ඒකීයත්වය වෙනුවෙන් පෙනී සිටිය යුතු ය. ඒකීය රාජ්‍යය ජාතිකත්වයේ උරගල විය යුතු ය. රාජපක්ෂ මහතා යනු අනගාරික ධර්මපාලතුමාගෙන් පසුව බ්‍රිතානීන් විසින් බිහිනොකරන ලද්දාවූ ද, ජාතිකත්වය හඳුනන්නාවූ ද නායකයා ය. බ්‍රිතානීන් විසින් බිහිකෙරුණු නායකයන්ට තවත් ඉඩ දිය යුතු නො වෙයි. ජාතික ආර්ථිකයකට පදනම දැමීමත් විජාතික සංස්කෘතික ආක්‍රමණය පරාජයකිරීමත් රටේ ඒකීයභාවය රැකගැනීමත් එතුමාගේ කාර්යභාරය වනු ඇත.

© Prof. Nalin De Silva